# නෙස්ලේ ලංකා මැගී රයිසි නූඩ්ල්ස් හඳුන්වා දෙයි

*ඉතා අනගි දේශීය සහල්වල විශිෂ්ඨත්වයෙන් සහ දිවි පිනවන කුකුළු මස් රසයෙන් ශ්‍රී ලාංකික පාරිභෝගිකයින් කුල්මත් කරයි*

ලොව ප්‍රමුඛතම පෝෂණ, සෞඛ්‍ය සහ සුවතා සමාගම වන නෙස්ලේ, දේශීය මැගී නූඩ්ල්ස් නිපැයුමක් වන "මැගී රයිසි" ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදී. ඉතා රසැති හා පෝෂණීය ගුණයෙන් යුත් මෙම නූඩ්ල්ස් නිෂ්පාදනය අනගි දේශීය සහල් සහ ශ්‍රී ලාංකිකයින් අතර ජනප්‍රිය කුකුළුමස් කරි රසයෙන් රසගන්වා තිබේ.

"ලොව ප්‍රකට නෙස්ලේ පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මගපෙන්වීම යටතේ අපේම දේශීය කණ්ඩායමක් විසින් නිපදවන ලද මැගී රයිසි ඔබට හඳුන්වා දෙන්නේ ඉතා සතුටිනි. මැගී රයිසි විශේෂයෙන්ම ශ්‍රී ලාංකිකයින්ගේ රස හා පෝෂණීය අවශ්‍යතාවයන් සපුරාලනු ඇති. අපේ දේශීය පාරිභෝගිකයින් පිළබඳව ඉතා ගැඹුරු වැටහීමක් සහිතව, මැගී යන සන්නාමය යටතේ ශ්‍රී ලාංකාවේ අනගි සහල්වල විශිෂ්ඨතාවය කුකුළුමස් රසය සමග මුසු කරනු ලැබ තිබෙනවා. රට පුරා අපේ මැගී පාරිභෝගිකයින් මෙම නව මැගී නූඩ්ල්ස් නිපැයුම තුළින් කුල්මත් කිරීමට අප බලාපොරොත්තු වෙනවා." මේ පිළිබඳව තම අදහස් දැක්වූ නෙස්ලේ ලංකා PLC කළමනාකාර අධ්‍යක්ෂ ඇලොයිස් හොෆ්බාර් මහතා පැවසීය.

"දේශීය වශයෙන් නිපදවනු ලබන මැගී රයිසි අපේ ගොවි ජනතාව විසින් වගා කරනු ලබන උසස්ම තත්ත්වයේ සහල් උපයෝගි කොට නිපදවනු ලබන අතර නෙස්ලේ සමාගමට ඔවුන්ගේ ජීවන පැවැත්මට සහ පොදුවේ ග්‍රාමීය ආර්ථිකයට යහපත් බලපෑමක් ඇති කිරීමට හැකියාව ලැබී තිබෙනවා. නෙස්ලේ සමාගමට සහ සමාජයට සාමූහික සාරධර්ම නිර්මාණය කිරීම අප ව්‍යාපාරවල යෙදෙන ස්වභාවයයි." හොෆ්බාර් මහතා වැඩි දුරටත් සඳහන් කළේය.

මෙම නව නිෂ්පාදනය හඳුන්වා දෙන ලද්දේ නෙස්ලේ සමාගම මගින් සමස්ත මැගී නූඩ්ල්ස් නිෂ්පාදන ධාරිතාව ව්‍යාප්ත කිරීමේ අරමුණින් යුතුව මෙම වසර මුල් භාගයේදී නව නූඩ්ල්ස් කර්මාන්ත ශාලාව විවෘත කිරීමෙන් අනතුරුවය. මෙම කම්හල මගින් බොහෝ දෙනෙකුට රැකියා අවස්ථාවන් ලබා දීම මගින් තවදුරටත් ග්‍රාමීය සංවර්ධනය සඳහා දයකත්වය ලබාදීමටද නෙස්ලේ සමාගමට හැකියාව උදකර දී තිබේ.

"මැගී "විනාඩි දෙකේ" නූඩ්ල්ස් 1984 වසරේ සිට ශ්‍රී ලාංකිකයින් පරම්පරා ගණනකට රසයක් ලබා දුන්නා." මේ පිළිබඳව තම අදහස් දක්වමින් නෙස්ලේ ලංකා PLC සහකාර උප සභාපතිනි ප්‍රියදර්ශනී කරුණාරත්න මහත්මිය පැවසුවාය. "ශ්‍රී ලාංකික නිවෙස්වල විශ්වාසය හා ජනප්‍රියත්වය හිමිකරගෙන සිටින මැගී වසර ගණනාවක් පුරා ශ්‍රී ලාංකික වැඩිහිටියන්ගේ වගේම ළමුන්ගේද හදවත් එක සේ දිනා ගැනීමට සමත්ව ඇති අතර එහි විවිධ වූ රසයන් සෑම වයස් කාණ්ඩයකම පාරිභෝගිකයින් පිනවීමට සමත්ව තිබෙනවා. පාරිභෝගිකයින් අප කෙරෙහි තබා ඇති විශ්වාසය තව දුරටත් පවත්වාගෙන යාම සඳහා උත්සාහ දරන වෙළෙඳ භාණ්ඩයක් ලෙස අප අපේ පාරිභෝගිකයාගේ ආහාර වේල සහ ජීවන රටාව

රසවත් කිරීමට හා ඊට වැඩි අගයක් එක්කිරීම සඳහා අඛණ්ඩ උත්සාහයක යෙදී සිටිනවා. ඒ අනුව අපේ හිතවත් පාරිභෝගකියින්ට දේශීය වශයෙන් ජනප්‍රිය ආහාර මුසුවක් වන බත් හා කුකුළුමස් රස ලබාදෙන මැගී රයිසි ඉදිරිපත් කරන්නේ දැඩි සතුටකින් යුතුවයි. මෙම මැගී රයිසි නූඩ්ල්ස් හඳුන්වා දීම, මැගී රසිකයන් හට ජනප්‍රිය දේශිය ආහාර ලබාදීම පිණිස, නෙස්ලේ තාක්ෂණය උපයෝගි කරගත් අවස්ථාවක්.”

ශ්‍රී ලංකාව ස්වයං පෝෂිත ආර්ථිකයක් වර්ධනය කිරීමේ දැඩි ලෙස අවධානය යොමුකොට සිටින අතර මැගී රයිසි එම අරමුණ සමග පෙල ගැසෙමින් ආහාර හා පාන නිපදවීම සඳහා දේශීය වශයෙන් නිපදවන අමුද්‍රව්‍ය භාවිතා කිරීම කෙරෙහි දැඩි ලෙස තම අවධානය යොමුකොට තිබේ. ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතා මෙම වසරේ ශ්‍රී ලංකාව සහලින් ස්වයංපෝෂිත වීම නිසා තිරිඟු පිටි පරිභෝජනය අඩු කිරීම සඳහා වන ඉලක්කයන් පිළිබඳව මෑතකදී ප්‍රකාශ කරන ලදී.